කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**2022 ඔක්තෝම්බර් මස 31 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2022 ඔක්තෝම්බර් මස 31 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

**ශ්‍රී ලංකාව ආසන්න පහල වායුගෝලයේ කැළඹිලි ස්වභාවයක් වර්ධනය වීම හේතුවෙන් දිවයින පුරා වැසි තත්ත්වයේ වැඩිවීමක් අපේක්ෂා කෙරේ.**

උතුරු, නැගෙනහිර සහ උතුරුමැද පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. සෙසු ප්‍රදේශවල සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

උතුරු, මධ්‍යම සහ සබරගමුව පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථානවලට මි.මී 100 ක පමණ තද වැසි ඇතිවිය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

**WEATHER FORECAST FOR 31 OCTOBER 2022**
**Issued at 05.30 a.m. on 31 October 2022**

**Due to a low-level atmospheric disturbance in the vicinity of Sri Lanka, showery condition is expected to enhance over the island.**

Showers or thundershowers will occur at times in Northern, Eastern and North-central provinces. Showers or thundershowers will occur elsewhere during the afternoon or night.

Heavy showers **about 100mm** are likely at some places in Northern, Central and Sabaragamuwa provinces and in Galle and Matara districts.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

### ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය
### 2022 ඔක්තෝම්බර් මස 31 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.

**වැසි තත්ත්වය:**

පුත්තලම සිට මන්නාරම**,** කන්කසන්තුරය සහ ත්‍රිකුණාමලය හරහා මඩකළපුව දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. සෙසු මුහුදු ප්‍රදේශවල සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං ඊසාන දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව හමා එයි. සුළගේ වේගය **පැ.කි.මී. (20-30)** පමණ වේ. පුත්තලම සිට කන්කසන්තුරය සහ මුලතිව් හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන්වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. 50** පමණ දක්වා වැඩිවිය හැක.

**මුහුදේ ස්වභාවය:**

පුත්තලම සිට කන්කසන්තුරය සහ මුලතිව් හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන්වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළුවේ. දිවයින වටාවන සෙසු මුහුදු ප්‍රදේශ සාමාන්‍ය ස්වභාවයේ පවතී.

**දිවයින ආසන්න පහල වායු ගෝලයේ වර්ධනය වෙමින් පවතින කැළඹිලි ස්වභාවය නිසා, මඩකලපුව සිට ත්‍රිකුණාමලය කන්කසන්තුරය සහ පුත්තලම හරහා කොළඹ දක්වා දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල විටින් විට ගිගුරුම් සහිත වැසි ඇති වීමේ ඉහල හැකියාවක් පවතින බැවින් එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ ඉතා රළු විය හැකියි. එබැවින් එම මුහුදු ප්‍රදේශවල කටයුතු කරන ධීවර සහ නාවික ප්‍රජාව මේ පිළිබඳව අවධානයෙන් කටයුතු කරනමෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

### WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS
### Issued at 05.30 a.m. on 31 October 2022

**Condition of Rain:**

Showers or thundershowers will occur at times in the sea areas off the coast extending from Puttalam to Batticaloa via Mannar, Kankasanturai and Trincomalee. Showers or thundershowers will occur at several places in the other sea areas during the evening or night.

**Winds:**

Winds will be north-easterly or variable in direction. Wind speed will be **(20-30) kmph**. Wind speed may increase up to **50 kmph** at times in the sea areas off the coast extending from Puttalam to Trincomalee via Kankasanturai and Mullaitivu.

**State of Sea:**

The sea areas off the coast extending from Puttalam to Trincomalee via Kankasanturai and Mullaitivu will be fairly rough at times. The other sea areas around the island will be slight.

**There is a higher chance of the occurrence of thundershowers in the sea areas off the coast extending from Batticaloa to Colombo via Trincomalee, Kankasanturai, and Puttalam due to the development of low-level atmospheric disturbance in the vicinity of Sri Lanka. Therefore, naval and fishing communities are requested to be vigilant during the activities in the aforementioned sea areas since there can be temporarily strong gusty winds and very rough seas during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි